# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2279/02 - 2022 මැයි මස 09 වැනි සඳුදා - 2022.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ පච්චිලෙපල්ලි ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන පච්චිලෙපල්ලි ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ පච්චිලෙපල්ලි ප්‍රාදේශීය සභාවේ අංක 05 මුල්ලෙයඩි කොට්ඨාසයට තේරී පත් වූ කිරුෂ්නන් වීරවාගුතේවර් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාලපරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම පච්චිලෙපල්ලි ප්‍රාදේශීය සභාවේ අංක 05 මුල්ලෙයඩි කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා යෝගේශ්වරී ප්‍රදාකරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පච්චිලෙපල්ලි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි වින්සන් ගුණාලන් වින්සන් ඥානදයාලන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් යෝගේශ්වරී ප්‍රදාකරන් පච්චිලෙපල්ලි ප්‍රාදේශීය සභාවේ, අංක 05 මුල්ලෙයඩි කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්. ජී. ඩබ්. ඥානදයාලන්,
තේරීම්භාර නිලධාරි,
පච්චිලෙපල්ලි ප්‍රාදේශීය සභාව.

2022 මැයි මස 05 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කිලිනොච්චි.

EOG 05 - 0027


1A - G 36735 — 16 (2022/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*